ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
இலங்கை தகவல் தொலைத்தொடர்பாடல் தொழில்நுட்ப நிறுவனம்
Information & Communication Technology Agency of Sri Lanka
An Agency under the Presidential Secretariat

ICTA ideas actioned

මගේ අංකය: Re-Gov/ICT Policy/

2011-07-18

**මහත්මයාණනි, මහත්මියනි,**

**ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය රාජ්‍ය ආයතනයන්හි ක්‍රියාත්මක කිරීම**

01. අමාත්‍ය මණ්ඩලය විසින් 2009-12-16 වැනි දින සියළුම රාජ්‍ය ආයතන විසින් අනුගත විය යුතු ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය අනුමත කරන ලද අතර එයට අනුගත වීම සඳහා අවශ්‍ය සියළු පියවර ගන්නා ලෙස දන්වමින් ජනාධිපති ලේකම් විසින් 2010-05-31 දින චක්‍රලේඛයක් නිකුත් කරන ලදි.

02. ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය රාජ්‍ය ආයතන තුල ක්‍රියාත්මක කිරීම සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් මෙය අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමට ජනාධිපති ලේකම් සභාපතිත්වය දරණ ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාව විසින් තීරණය කර ඇත. ඒ අනුව මෙම ප්‍රතිපත්තියේ කරුණු 40කට අනුගත වීම සඳහා 2011 ජූලි 15 දිනට පෙර කටයුතු කරන ලෙස මෙන් SB/5/1/ICTA/Re-Gov අංක දරන චක්‍රලේඛයක් ද ජනාධිපති ලේකම් විසින් 2011-06-24 දින නිකුත් කරන ලද අතර එහි පිටපතක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවමි (කරුණාකර ඇමුණුම 1 බලන්න).

03. ඔබ අමාත්‍යාංශය තුල ඉ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය සහය හා මග පෙන්වීම ලබා දීමට අප ආයතනය සූදානම් ව සිටින බැව් සතුටින් දැනුම් දෙමු. ඉ-රාජ්‍ය ප්‍රතිපත්තියේ මෙම ඉතා වැදගත් වූ අවශ්‍යතා 40 සමඟ ඔබ ආයතනය අනුගත වන අයුරු දැක්වීම සඳහා භාවිතා කළ යුතු ආකෘති පත්‍රයේ මුද්‍රිත පිටපතක් මේ සමඟ ඔබ වෙත එවමි. එම අවශ්‍යතා 40 සමග අනුගත වීම තහවුරු කිරීම සඳහා සම්පූර්ණ කළ යුතු ආකෘති පත්‍ර පෙළක්ද මේ සමඟ අමුණා ඇත (මෙම ආකෘති පත්‍ර http://www.icta.lk/index.php/en/e-governement-policy වෙත පිවිසීමෙන් හෝ ප්‍රධාන නවීකරණ නිලධාරීන්ගේ අන්තර්ජාල සංසදය (CIO FORUM) වෙතින් බා ගත හැක). උක්ත චක්‍රලේඛය මගින් ජනාධිපති ලේකම් විසින් නියෝග කර ඇති පරිදි එම ආකෘති පත්‍ර සම්පූර්ණ කොට **2011 අගෝස්තු මස 15 දිනට පෙර** මා වෙත එවන මෙන් කාරුණික ව ඉල්ලමි.

04. මෙම ප්‍රතිචාර විශ්ලේෂණය කර 2011 ජූලි මස අවසන වන විට එක් එක් රාජ්‍ය ආයතනයේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති සූදානම් තත්වය දැක්වෙන ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති සූදානම් දර්ශකය ප්‍රසිද්ධියට පත් කෙරෙනු ඇත. (මීට පෙර පළ කළ ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති සූදානම් දර්ශකය http://www.icta.lk/index.php/en/e-governement-policy වෙතින් ලබා ගත හැක).

මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර දැන ගැනීමට අවශ්‍ය වේ නම් 0112 – 369099 දිගුව 250 හරහා මෙම කටයුතු බාර ව්‍යාපෘති කළමණාකරු වන සමීර ජයවර්ධන අමතන මෙන් කාරුණික ව ඉල්ලමි.

05. මෙම ලිපියේ පිටපත් ඉ-තැපැල මගින් ද එවා ඇත.

ස්තුතියි.
මීට විශ්වාසී,
**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය**

**වසන්ත දේශප්‍රිය**
අධ්‍යක්ෂ,
රාජ්‍ය අංශය ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන

**පිටපත්: ප්‍රධාන නවීකරණ නිලධාරී**

eSri Lanka smart people smart island

160/24, කිරිමණ්ඩල මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව 160/24, கிரிமண்டல மாவத்தை, கொழும்பு 5, இலங்கை 160/24, Kirimandala Mawatha, Colombo 05, Sri Lanka

දුරකතන : தொலைபேசி: Tele : +94-11-2369099
ෆැක්ස් : தொலை நகல் : Fax : +94-11-2369091
ඊ මේල්: ஈமெயில்: E-mail: info@icta.lk
වෙබ් : இணையம் : Web : www.icta.lk